# (ඌ) රැකීරක්‍ෂා හා කම්කරු සම්බන්ධතා

**රැකීරක්ෂා**

ශ්‍රම වෙළෙඳ පොළ මැනවින් සංවිධානය වී නොමැති ලංකාව වැනි රටක රැකීරක්ෂා හා විරක්ෂා පිළිබඳව විශ්වාසදයක වූත්, විස්තරාත්මක වූත්, සංඛ්‍යා තොරතුරු ලබාගත හැක්කේ ඒ අරභයා කැරෙන විශේෂ සමීක්ෂණ මගින් පමණෙකි. රැකීරක්ෂා පිළිබඳ සියළු අංශ අළලා සංඛ්‍යා තොරතුරු එක්රැස් කිරීම එකම අරමුණ කොට ගත් එවැනි සමීක්ෂණයක් 1959/60 දී පවත්වන ලදී. 1963 ලංකා පාරිභෝගික අය වැය සමීක්ෂණයද, එහි මූලික අරමුණ අනෙකක් වුවද, මෙම විෂය අළලා වැදගත් තොරතුරු සපයා ඇත. ගම්බද ජනතාවගේ රැකීරක්ෂා හා විරක්ෂා ප්‍රශ්න පිළිබඳව, ආදර්ශ ගම් දහතුනක් තෝරාගෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ විශේෂඥයකු විසින් 1964 දී කැරුන පරීක්ෂණයක වාර්තාවක් ද ඇත. කෙසේ වුවද, පසුව කී පරීක්ෂණය සඳහා භාජන වූ ආදර්ශ ගම් දූරාවාරයේ තෝරාගත් ඒවා නොවූ නිසා සාවද්‍ය විය හැකි බැවින් පරීක්ෂණයෙහි ප්‍රතිඵල පරිස්සමෙන් උපයෝගී කරගත යුතුව ඇත. 1959/60 සමීක්ෂණයෙන් හෙළිකළ පරිදි, ලංකාවේ රැකීරක්ෂා රහිත අයගේ මුළු සංඛ්‍යාව 3,40,000 ක් විය. 1963 දී පවත්වන ලද පාරිභෝගික අය වැය සමීක්ෂණයෙහි රැකීරක්ෂා නොමැති අයගේ සංඛ්‍යාව 4,58,000 ක් හැටියට ඇස්තමේන්තු කැරිණි.

කම්කරු දෙපාර්තමේන්තුව විසින් ලංකා කම්කරු ගැසට් පත්‍රයෙහි පළ කැරෙන රැකීරක්ෂා නැතියවුන් පිළිබඳ මාසික සංඛ්‍යා වලින් රැකීරක්ෂා සඳහා හා වඩා හොඳ රක්ෂා සඳහා රැකීරක්ෂා කාර්යාල වල ලියාපදිංචි වී ඇති අයගේ මුළු සංඛ්‍යාව දැක්වේ. මෙම සංඛ්‍යා වලින්, රැකීරක්ෂා නොමැති අයගේ මුළු සංඛ්‍යාව නොදැක්වෙන නමුදු, සාමාන්‍ය වශයෙන්, යම් කාලයක්තුළ පවත්නා විරක්ෂා හැඩ ගැස්ම දැක්වේ.

1965 වසරේ අවසන් හරියේ දී රැකී රක්ෂා සඳහා ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යා වේගයෙන් වැඩි වන්නට විය. මෙම හැඩ ගැස්ම 1966 මුල් කාර්තුවේ අවසානය දක්වා ම දිගින් දිගට ම පැවතිණි. එහෙත් දෙ වැනි කාර්තුව තුළ වැඩි වෙනසක් නොදැක්වූ ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යා තෙ වැනි කාර්තුව තුළ යළිත් වේගයෙන් වැඩිවිය. කෙසේ වුවද, අවසන් කාර්තුව තුළ මෙම සංඛ්‍යා කෙමෙන් පහළ වැටිණි.

1966 දී රැකී රක්ෂා සඳහා ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යාව සියයට 19 කින් වැඩි විය. 1965 දී මෙය සියයට 20 කින් ද, 1964 දී සියයට 7 කින් ද වැඩිවී තිබිණි. 1966 දී ඒ ඒ වර්ගයන් සඳහා ලියා පදිංචි වූවන්ගේ සංඛ්‍යා, අර්ධ පුහුණු සියයට 23 ක්, නුපුහුණු සියයට 21 ක්, කාර්මික හා ලිපිකරු වෘත්තීන් සියයට 19 ක් හා පුහුණු සියයට 8 ක් යන අයුරින් වැඩි විය. මෙම සංඛ්‍යා 1965 වසර සඳහා වූ අනුරූප සංඛ්‍යා වන 27, 10, 34 හා 12 සමග සැසැඳිය හැකිය.

මෑත වර්ෂ වල දී රැකී රක්ෂා කාර්යාල මගින් රැකියා ලබා දෙනු ලැබූ අයගේ සංඛ්‍යා II (ඌ) 1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

### සංඛ්‍යා සටහන II (උ) - 1

### රැකියා ලබාදෙනු ලැබූ අයගේ සංඛ්‍යා හා ඒ ඒ වර්ගයෙන් ලියා පදිංචි වී ඇති සංඛ්‍යාවට ඒවායේ ඇති සියයට ගණන

| වර්ෂය | කාර්මික හා ලිපිකරු | % | පුහුණු | % | අර්ධ පුහුණු | % | නුපුහුණු | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1956 | 1,913 | 11·9 | 845 | 8·6 | 1,565 | 6·1 | 4,162 | 12·1 | 8,485 | 9·9 |
| 1957 | 1,176 | 6·3 | 709 | 5·3 | 1,180 | 3·8 | 3,053 | 6·4 | 6,118 | 5·5 |
| 1958 | 1,827 | 9·2 | 800 | 5·9 | 1,006 | 3·1 | 2,251 | 4·4 | 5,884 | 5·0 |
| 1959 | 1,667 | 8·0 | 1,045 | 7·5 | 1,275 | 3·8 | 3,218 | 5·4 | 7,205 | 5·6 |
| 1960 | 1,400 | 5·3 | 771 | 4·6 | 1,247 | 3·6 | 4,744 | 6·5 | 8,162 | 5·4 |
| 1961 | 1,259 | 4·6 | 631 | 3·5 | 964 | 2·8 | 2,794 | 3·9 | 5,648 | 3·7 |
| 1962 | 1,263 | 3·7 | 468 | 2·7 | 809 | 2·3 | 2,315 | 3·5 | 4,857 | 3·2 |
| 1963 | 1,322 | 3·7 | 502 | 3·0 | 836 | 2·3 | 2,466 | 3·9 | 5,129 | 3·4 |
| 1964 | 1,722 | 4·4 | 535 | 3·1 | 945 | 2·5 | 3,599 | 5·5 | 6,801 | 4·3 |
| 1965 | 1,495 | 2·7 | 846 | 4.2 | 1,035 | 2·1 | 3,753 | 5·0 | 7,129 | 3·6 |
| 1966 * | 1,048 | 1·6 | 749 | 3·5 | 910 | 1·5 | 4,149 | 4·6 | 6,865 | 2·9 |

සංඛ්‍යා : කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

* තාවකාලිකයි

**රාජ්‍යාංශයේ රැකී රක්ෂා**

රාජ්‍යාංශයේ රැකියා සංඛ්‍යාවෙහි අඩුවැඩිවීම පිළිබඳව 1965 දී මහ බැංකුව විසින් පවත්වන ලද පරීක්ෂණය යළිත් 1966 දී ද පවත්වන ලදී. රජයේ සියළුම දෙපාර්තමේන්තු වලින් හා අර්ධ රාජ්‍ය ආයතන වලින් විමසා යවන ලදුව, රජයේ දෙපාර්තමේන්තු වලින් සියයට 58 කින් ද, අර්ධ රාජ්‍ය ආයතන වලින් සියයට 56 කින් ද, සංඛ්‍යා තොරතුරු ලබා ගැනීමට මහ බැංකුවට හැකි විය. අර්ධ රාජ්‍ය ආයතන වලට රජයේ සමායතන හා විශ්ව විද්‍යාල වැනි ආයතන ද, මහ බැංකුව ද, ඇතුළත් වෙයි.

1966 වසර අවසන් වන විට, පරීක්ෂණයට පිළිතුරු සැපැයූ රජයේ දෙපාර්තමේන්තු 45 හේ නිරතව සිටි සේවකයන්ගෙන් සියයට 67 ක් ස්ථිර සේවකයන් වූ අතර, සියයට 10 ක් තාවකාලික සේවකයෝ ද, සියයට 23 ක් අනියම් සේවකයෝ ද, වූහ. 1965 අවසානයේ මෙම දෙපාර්තමේන්තු 45 හේ අනුරූප සංඛ්‍යා පිළිවෙළින් සියයට 69 ක්, 11 ක් හා 20 ක් විය. වර්ෂය ආරම්භයේ හා අවසානයේ රැකියාවල නියුතු වූවන්ගේ සංඛ්‍යා වල වෙනස රැකීරක්ෂා වෙනස්වීම මැණීම සඳහා උපයෝගී කොට ගෙන, 1966 දී රජයේ දෙපාර්තමේන්තු වල ස්ථිර හා තාවකාලික රැකියා සියයට 4 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

බැංකුවට සංඛ්‍යා තොරතුරු ලබා ගත හැකි වූ අර්ධ රාජ්‍ය ආයතන 25 හි සේවකයන් අතුරින් සියයට 82 ක් ස්ථිර සේවකයෝ ද, සියයට 2 ක් තාවකාලික සේවකයෝ ද, සියයට 16 ක් අනියම් සේවකයෝ ද වූහ. 1965 වසර අවසානයේ අනුරූප සංඛ්‍යා පිළිවෙළින් සියයට 86 ක්, 3 ක් හා 11 ක් විය. වාර්තා කර ඇති පරිදි, අර්ධ රාජ්‍ය ආයතන වල ස්ථිර හා තාවකාලික රැකියා සියයට 13 කින් වැඩි වී ඇත.

**කම්කරු සම්බන්ධතා**

1965 හා 1966 වර්ෂයන් තුළ වැඩ වර්ජන සංඛ්‍යාව මෙන් ම වැඩ වර්ජන නිසා නැති වූ මිනිස් දවස් සංඛ්‍යාව ද, වේගයෙන් පහත බැස ඇත. නිදසුන් වශයෙන්, 1965 නැතිවූ මිනිස් දවස් ගණන

1964 දීට වඩා සියයට 35 කින් අඩු වූ අතර, 1966 වසර තුළ නැති වූ මිනිස් දවස් ගණන (එම වසර සඳහා වූ තාවකාලික සංඛ්‍යා අනුව) 1965 සංඛ්‍යාවට වඩා සියයට 67 කින් පමණ අඩු විය.

1966 වසර තුළ වැවිලි අංශයේ නැති වූ මිනිස් දවස් ගණන, 1955 න් පසුව වූ අඩු ම ගණන වූ අතර, ඉකුත් දශකය තුළ නැති වූ දවස් ගණනෙහි වාර්ෂික සාමාන්‍යයට වඩා සියයට 57 කින් අඩු විය. වැවිලි නොවන අංශයෙහි මෙම අඩුවීම වඩාත් වේගවත් වූයේ, දශකය සඳහා වූ සාමාන්‍ය යට වඩා සියයට 90 කින් අඩු විය.

වැඩ වර්ජන සංඛ්‍යාව, ඊට සම්බන්ධ වූ සේවකයන්ගේ සංඛ්‍යාව හා වැඩ වර්ජන නිසා නැති වූ මිනිස් දවස් ගණන II (ඉ) 2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## සංඛ්‍යා සටහන II (ඉ) – 2

## වැඩ වර්ජන

| වර්ෂය | වැවිලි | | | වෙනත් රැකියාවන් | | |
|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ කම්කරුවන් | නැති වූ මිනිස් දවස් | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ කම්කරුවන් | නැති වූ මිනිස් දවස් |
| 1956 | 99 | 56,908 | 200,888 | 115 | 31,852 | 152,966 |
| 1957 | 177 | 297,061 | 618,050 | 127 | 70,239 | 190,443 |
| 1958 | 123 | 39,372 | 340,632 | 96 | 42,713 | 399,228 |
| 1959 | 177 | 47,318 | 352,095 | 71 | 42,453 | 460,141 |
| 1960 | 123 | 42,528 | 259,948 | 37 | 4,839 | 15,139½ |
| 1961 | 90 | 29,223 | 317,866 | 39 | 38,013 | 170,372 |
| 1962 | 138 | 42,569 | 193,792 | 50 | 25,730 | 801,882 |
| 1963 | 174 | 62,511 | 359,905 | 58 | 29,819 | 479,678 |
| 1964 | 201 | 68,009 | 611,060 | 103 | 21,400 | 274,623 |
| 1965 | 175 | 70,929 | 482,259 | 55 | 10,085 | 89,952 |
| 1966* | 117 | 35,944 | 159,327 | 32 | 4,007 | 29,571 |

සංඛ්‍යා : කම්කරු දෙපාර්තමේන්තුවෙනි.

* තාවකාලිකයි.

වැඩ වර්ජන සඳහා හේතු වූ ප්‍රධාන කරුණු අතර සාපේක්ෂක වැදගත්කම වර්ෂයන් තුළ නොවෙනස්වම වාගේ පැවතිණි. පසුගිය වර්ෂ වල දී මෙන්, 1966 යේ වැඩ වර්ජන වලින් සියයට 25 ක් සඳහා හේතු වූයේ රැකියා අහිමි වීමය. තවත් සියයට 32 ක් වතු වල නීති, වැඩ පිළියෙළ කිරීම ආදිය නිසා ද සියයට 10 ක් ගෙවීම ප්‍රමාද කිරීම නිසා ද, සියයට 15 ක් සාමාන්‍ය ඉල්ලීම් දිනා ගැනීම සඳහා ද, කැරිණි.